ධර්ම දේශනාව
26. 01.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අද මේ පින්වතුන්ට මම භවාංග සිතේ එක්තරා විදියක ගුණ ස්වභාවයක් මතක් කරලා දෙනවා. පරණ ධර්ම කරුණුත් ඒ අනුසාරයෙන් මේ පින්වතුන්ට මතක් කර ගන්නත් පුළුවන්. සමහර අය මේ කාරණයට අලුත්. සමහර අයට යම් තරම් දැනුමක් තිබෙනවා. සමහර අයට හොඳ දැනුමක් තිබෙනවා. ඒ හැම එක්කෙනාටම මේ කාරණය මේ ධර්ම කොට්ඨාශය හොඳ වැටහීමක් අවබෝධයක් හදා ගන්න ප්‍රයෝජනවත් වේවි. හැම කෙනාටම මේ දහම් කරුණු ටික හොඳින් වැටහේවා කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා.

භවාංග සිත හොඳට තේරුම් ගන්න. භවාංග සිත කියලා කියන්නේ භවයේ ප්‍රධාන අංගයක් හැටියට පවතින සිතයි. භවාංග සිතට කියනවා ප්‍රභාශ්වර සිත කියලා. මූල චිත්තය කියලත් හඳුන්වනවා. භවාංග සිත ඇතිවෙන විදිය අපි මේ විදියට තේරුම් ගනිමු.

භාවංග සිත කියලා කියන්නේ දැනට අපේ ජීවිතියේ ප්‍රතිසන්ධියෙන් පස්සේ ඇතිවෙන්නා වූ සිත. ජීවිතියේ ඉස්සෙල්ලාම පහළ වෙන මුල්ම හිත ප්‍රතිසන්ධි සිතයි. ප්‍රතිසන්ධි සිතක් පහළ වෙන්නේ ඉස්සරවෙලා කරපු කර්මයක විපාකයක් හැටියට. ප්‍රතිසන්ධි සිත කියන එක කර්ම සිතක් නොවෙයි. ප්‍රතිසන්ධි සිත කියලා කියන්නේ විපාක සිතක්. විපාක සිතක් පහළ වෙන්න ඊට ඉස්සෙල්ලා කර්ම සිතක් ඇති වෙන්න ඕන. හොඳට තේරුම් ගන්න කර්ම සිතෙයි විපාක සිතෙයි වෙනස. එහෙම නැත්නම් කර්ම විඤ්ඤාණය සහ විපාක විඤ්ඤාණය. කර්ම විඤ්ඤාණයක් හැදෙන්නේ කර්මයක් කරන වේලාවේදී. හොඳ පැත්තට නම් දානයක් දෙනකොට පිනක් දහමක් කරනකොට. අකුසල කර්මයක් කරනකොට එනම් නරක වැඩක් හොරකමක් කරනකොට කර්ම සිත් පහළ වෙනවා. ඒ කර්ම විඤ්ඤාණයේ ප්‍රතිඵලයක් හැටියට තමයි විපාක විඤ්ඤාණය පහළ වෙන්නේ.

ප්‍රතිසන්ධිය කියලා කියන්නේ කර්ම හැදෙන තැනක්ද විපාක හැදෙන තැනක්ද? විපාක හැදෙන තැනක්. ඒක නිසා ප්‍රතිසන්ධි සිතට කියනවා 'විපාක සිත' නැත්නම් 'විපාක විඤ්ඤාණය' කියලා. ඉස්සරවෙලා හිටපු තැනක තමන් කරපු කර්මයක විපාකයක් හැටියට තමයි ප්‍රතිසන්ධිය ඇතිවෙන්නේ. ජීවිතයක ඉස්සෙල්ලාම පහළ වෙන හිත විපාක සිතක්. ඒ ප්‍රතිසන්ධි සිත පහළ වෙච්ච ගමන්ම දෙවෙනුව ප්‍රතිසන්ධි සිතට සමාන ප්‍රතිසන්ධි සිතේ හැඩ වැඩ තිබෙන ප්‍රතිසන්ධි සිතට සමාන චෛතසික ධර්ම තිබෙන්නාවූ තව සිතක් පහළ වෙනවා. ඒකට කියනවා භවාංග සිත කියලා.

අපි ඇසින් දකින කනින් අහන සිත් භවාංග සිත් නොවෙයි. ඒවා අරමුණක් දකින්න අරමුණක් අත්විඳින්න ක්‍රියාත්මක වෙන සිත්. අපි යමක් බලන්නේ නැති, යමක් අහන්නේ නැති, ගඳ සුවඳක් විඳින්නේ නැති, රසක් විඳින්නේ නැති, ඒවාගේම කායික වින්දනයක් නැති, සිතෙනුත් යමක් සිත සිතා ඉන්නේ නැති සෑම අවස්ථාවකම පහළ වෙන්නේ භවාංග සිත්.

භවාංග සිත හරියට මේ වගේ. ඇල්ලකින් වතුරක් වැටිලා ඒ වතුර එක්තරා විදියකට smoothly, ගලනවාද නැත්ද කියලවත් නොපෙනෙන තත්වයකට ගලාගෙන යන තැන් තිබෙනවා දැකලා ඇති. සමහර තැන් තිබෙනවා flat. ඒ තැන් වලට වතුර වැටෙනවා. ඒ වතුර ටික ඉස්සරහට ගලනවාද නැත්නම් එහෙමම තිබෙනවාද කියලා දන්නේ නැති තත්වයට බොහොම smoothly යනවා. ඒක එක තැන හිටලා තියෙනවා වගෙයි අපිට පෙනෙන්නේ. ආන්න ඒ වගේ ගිහිල්ලා තවත් තැනකින් ඒ වතුර පල්ලෙහාට බහිනවා.

මේ භවාංග flow එක තිබෙන්නේත් එක ගානට. ඉස්සෙල්ලා භවාංගයේ rate එකයි ඊළඟ භවාංගයයි දෙකම එකයි. සීතල කාලයට භවාංග සීතල වැඩියි, අව්ව කාලයට භවාංගය සැර වැඩියි කියල එහෙම භවාංග නෑ. ඒවා එක ගානට smoothly යනවා. භවාංග සිත ප්‍රතිසන්ධි සිතට සමානයි නමුත් වැඩ දෙකයි. භවාංග සිත් වලින් ප්‍රතිසන්ධි වෙන්නේ නෑ. ඒක ඉස්සෙල්ලාම පහළ වෙච්ච නිසා ඒකට **ප්‍රතිසන්ධි සිත** කියලා කියනවා. ඒක මුල් වෙලා තමයි මේ භවාංග සිත් ගලාගෙන යන්නේ. ඔහොම ගිහිල්ලා ගිහිල්ලා අවසානයේදී මේ ආපු flow එක භවාංගයකින්ම නැතිවෙලා යනවා. එතකොට අවසාන භවාංග සිත අපි භවාංග සිතක් හැටියට කථා කරන්නේ නෑ. ඒකට වෙන නමක් කියනවා. ඒකට කියනවා **චුති සිත** කියලා.

ඒක හරියට කියනවා නම් අපි මෙහෙ ඉඳලා airport එකට යනවා. අපි airport එකේදී වෙනස් වෙනවා. අපි හිතමු ජගත් මහත්තයා මෙහෙ ඉඳලා Wellington යනවා. දැන් ජගත් මහත්තයා airport එක ඇතුලට යනවා. අපි ඇතුලට ගිහිල්ලා departure area එකට යනකොට එතැන ගහලා තිබෙන්නේ passengers only කියලා. එතකොට air plane එකට යන්නේ passenger කෙනෙක්. ගිහිල්ලා බහින්නේ passenger කෙනෙක්. නමුත් බැහැලා එළියට යන්නේ ජගත් මහත්තයා. එක තැනකදී හඳුන්වන අකාරය වෙනස් වෙනවා. ආන්න ඒ වගේ කරන වැඩේට අනුව තමයි සිත හඳුන්වන්නේ. passengers ල වගේ තමයි භවාංග flow එක. Airport එකට ගියේ ජගත් මහත්තයා. බැහැල ගියෙත් ජගත් මහත්තයා. මැද තිබුණේ passenger flow එක. ඒවගේ පළවෙනිම සිත **ප්‍රතිසන්ධි සිත**. මැද flow එකට කියනවා **භවාංග** කියලා. සිත කඩා හැලෙන එකට කියනවා **චුති සිත** කියලා. දැන් අපි ඉන්නේ කරුණු දෙකෙකට මැද. ඒ තමයි ප්‍රතිසන්ධියටයි චුතියටයි මැද.

අපි බණ අහන්නේ ප්‍රතිසන්ධි සිත් වලිනුත් නොවෙයි, භවාංග සිත් වලිනුත් නොවෙයි, චුති සිත් වලිනුත් නොවෙයි. දැන් මේ පහළ වෙන සිත් කර්ම හැදෙන සිත්. භවාංග සිත් වලින් බණ අහන්න බෑ. ඒවා විපාක සිත්. අපි රූපයක් බලනවා, එතකොට චක්ඛු විඤ්ඤාණ

පහළ වෙනවා, ඒවා විපාක. ඊළඟට චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු ඒවා ගැන හිත හිතා ඉන්නවා. බලනවා කියලා කරන වැඩේ තමයි හිතින් බල බල සිටීම. හිතෙන් තමයි වැඩිපුර බලන්නේ. ඒවා ක්‍රියාත්මක සිත්. අහනකොටත් එහෙමයි. ක්‍රියාත්මක සිත් පහළ වෙනවා. ගඳ සුවඳ දැනෙන කොටත් ක්‍රියාත්මක සිත් පහළ වෙනවා. ස්පර්ශය දැනෙන කොටත් පහළ වෙන්නේ ක්‍රියාත්මක සිත්. හිත හිතා ඉන්න කොටත් පහළ වෙන්නේ අරමුණට අනුව ක්‍රියාත්ම වෙන අරමුණු දැන ගන්න සිත්. ඒ සිත් භාවංග නොවෙයි.

දැන් අපි කිව්වා අපි ඉන්නේ සිත් දෙකක් මැද කියලා. ඒ තමයි ප්‍රතිසන්ධි සිත සහ චුති සිත. ඒ අතර වැඩියෙන් අපිට තිබෙන්නේ භවාංග සිත්. ඒ භවාංග සිත් හැම වේලේම මන්දගාමීයි සෞම්‍යයයි සැපයි. ඒ කියන්නේ ඒවා එක ගානකට යන්නේ. අපි හිතමු අපිට පැය තුන හතරක් හොඳට නින්ද ගිහිල්ලා ඇහැරුනාට පස්සේ එක පාරටම නැගිටලාදුවන්න බෑ. ඒ වේලාවට අපිට දැනෙනවා ඇඟට හරි සනීපයක්. හරි සැහැල්ලු සනීප ගතියක් දැනෙනෙවා. ඒ මොකක්ද ඒ දැනෙන්නේ? ඒ දැනෙන්නේ අර භවාංග සිතට සමානව හදාපු රූපවල ස්වභාවය. එක පාරටම කඩාගෙන නැගිටින්න කම්මැලි ගතියක් ඒවාගේම නැවතත් භවාංග වෙන්න උවමනා ගතියක් ඒවෙලාවට තිබෙනවා. ඒක නිසා භවාංග සිත විපාක සිතක්. අපි නිදාගෙන ඉන්නවා කියලා කියන්නේ විපාකයක් විඳිනවා කියන එකයි.

අපිට ලෙඩක් හැදිලා අපි දොස්තර මහත්තයා ගාවට ගිහිල්ලා අපේ ලෙඩේ දොස්තර මහත්තයාට කිව්වට පස්සේ එයා කරන්නේ සමහර වෙලාවට බෙහෙත් දෙනවා. දීලා කියනවා හොඳට rest කරන්න කියලා. ඒ කියන්නේ අපේ ලෙඩේ, අපේ කරුමයටම බාර දෙනවා. භවාංග හිත කියන්නේ කර්ම විපාකයක්. ඒ කර්ම විපාකටය ‘rest’ එකක් කියලා නමක් දාලා අපි අපේ කර්ම විපාකයෙන්ම නිදාගෙන ඉඳලා ඒකෙන්ම සනීප වෙනවා. දැන් ඔය විදියට භවාංග flow එකක් තමයි තිබෙන්නේ. ඒක හරි සනීපයි.

අපිට යම් කිසි දෙයක් අහන්න ඕන වෙනකොට භාවංගය නවතිනවා. ඒ වෙනුවට ක්‍රියා සිත් ටිකක් එනවා. බලනවා, අහනවා, හිතනවා, දැනගන්නවා, ස්පර්ශ කරනවා. ඊට පස්සේ ආයිත් යන්නේ භවාංගයට. අපිට යම් කිසි දෙයක් හිතුවා කියන එක තේරෙනවා නමුත් නැවතත් භවාංගයට ගියා කියන එක තේරෙන්නේ නෑ. ඒක ඒ තරම්ම සියුම්. ඒ තරම්ම සියුම් විදියට නොදැනෙන්න තමයි භවාංගය තිබෙන්නේ. නැවතත් ක්‍රියාත්මක සිතුවිලි ඇතිවෙනවා. ඒවායෙන් අහනවා නැවතත් භවාංග වෙනවා. දැන ගන්නවා නැවතත් භවාංග වෙනවා. ඔහොම තමයි ඕක තිබෙන්නේ. අපි ජීවත් වෙන හැම කාලයකම අපිට වැඩියෙන්ම පහළ වෙන්නේ භවාංග සිත්. අනිත් පහළ වෙන හැම සිත් පේළි දෙකක් අතරතුරේ පහළ වෙන්නේ භවාංග සිත්. Unconscious උනහමත් පහළ වෙන්නේ භවාංග සිත්. අන්න එහෙම ගතියක් තිබෙනවා. භවාංග සිත් වලින් හීන දකින්න බෑ. ඔන්න ඔය විදියයි ඕක.

දැන් බලන්න ප්‍රතිසන්ධි සිත විපාක සිතක්. භවාංග සිත විපාක සිතක්. චුති සිතත් විපාක සිතක්. ඔය තුනම විපාක සිත්. විපාකයක් විඳින්න ආපු තැනකදී අපි ඒක base කරගෙන කර්ම හදා ගන්නවා.

අපි භාවනා කරනවා. එතකොට ක්‍රියාත්මක වෙන්නේ හොඳට සිහියෙන් යුක්ත වෙච්ච විර්යයෙන් යුක්ත වෙච්ච ශ්‍රද්ධාව හොඳට මේරිලා තිබෙන්නා වූ සිත්. ඒ සිත් වලින් තමයි භාවනා කරන්න පුළුවන් කම තිබෙන්නේ. දැන් අපි භාවනා කරගෙන භාවනා කරගෙන යනවා. විදර්ශනා භාවනා සිත් පහළ වෙනවා. සමථ භාවනා සිත් පහළ වෙනවා. ඒවා මොනවාද? ඒවා කර්ම හැදෙන්නා වූ හොඳ ක්‍රියාත්මක සිත්. ඒවා කුසල වශයෙන් ක්‍රියාත්මක වෙන සිත්. ඒ සිත්වල විපාක ලැබෙන්නේ ඉස්සරහට. දැන් ඔය විදියට සිත් පහළ වෙනකොට යම්කිසි වෙලාවක අපි විපස්සනා කරලා නිවන් අවබෝධ කර ගන්නවා. නිවන් අවබෝධ කරගන්න කොට නිවන් දකින්නේ භවාංග සිතකින් නොවෙයි. නිවන් දකින්නේ ප්‍රඥාව වැඩියෙන්ම ඉතාම ඉහළින්ම operate වෙන සිතකින්. ඒකට කියනවා **මාර්ග සිත** කියලා. ඒ මාර්ග සිතෙන් තමයි අපි නිවන් දකින්නේ, නිවන් අවබෝධ කරගන්නේ. ඉස්සෙල්ලාම නිවන පැත්තට හැරෙන හිතට කියනවා **ගෝත්‍රභූ සිත** කියලා. නමුත් කෙලෙස් නසමින් ගිහිල්ලා නිවනේ හැපෙන සිත තමයි මාර්ග සිත. ඊළඟට නිවන් දැක්කා. ඒ අපි දැකපු නිවන අත් විඳින්නා වූ සිත තමයි **ඵල සිත**. ඒ කියන්නේ මාර්ගයෙන් ලබාදීපු ටික experience කරන සිතට කියනවා **ඵල සිත** කියලා. ඔන්න ඔය විදියට සෝවාන් උනා. ඒක භවාංග සිතක් නොවෙයි. ඒ හොඳ ක්‍රියාත්මක ප්‍රභාශ්වර ආලෝකමත් සිතක්.

සකෘදගාමී වෙනකොටත් ඔය වගේ. සකෘදගාමි මාර්ග සිතෙන් නිවන ස්පර්ශ කරනවා ටිකක් වැඩියෙන්. ඵල සිතෙන් විඳිනවා. අනාගාමී වෙනකොටත් එහෙමයි. අනාගාමි මාර්ග සිතෙන් නිවන ගැඹුරට ස්පර්ශ කරනවා. ඵල සිතෙන් විඳිනවා. රහත් වෙන කොටත් ඒවගෙයි. රහත් මාර්ග සිතෙන් නිවන සම්පූර්ණයෙන් ස්පර්ශ කරනවා. ඵල සිතෙන් ඒ සපර්ශ කරපු නිර්වාණය විඳිනවා. දැන් මේ විදියටයි මේක සිද්ධ වෙන්නේ. දැන් මෙතැනට භවාංග සිතක් ආවද? නෑ. මෙන්න මේ කාරණය තේරුම් ගන්න. ප්‍රතිසන්ධි සිතට අරමුණක් තිබෙන්න ඕනෑ. භවාංග සිතට අරමුණක් තිබෙන්න ඕනෑ. චුති සිතටත් අරමුණක් තිබෙන්න ඕනෑ. මාර්ග සිතට අරමුණක් තිබෙන්න ඕනෑ. ඵල සිතට අරමුණක් තිබෙන්න ඕනෑ. හොඳට තේරුම් ගන්න.

දැන් අපි බණ අහනවා. එතකොට සිත් පහළ වෙනවා. එතකොට අහන්න සද්ද අරමුණක් තිබෙනවා. අපිට දැන ගන්න දෙයක් තිබෙනවා. එතකොට ප්‍රතිසන්ධිය ඇතිවෙන වේලාවේ ප්‍රතිසන්ධි සිතට අරමුණක් තිබෙන්න ඕනෑ. ඒ ප්‍රතිසන්ධියට එන අරමුණ මැරෙන්න කලින් කර්මය හෝ කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත කියලා අරමුණු තුනෙන් එකක් අපිට ඉස්සරහට එනවා. ඒ ආපු එකක් තමයි ප්‍රතිසන්ධියේදී ඒ සිතට අරමුණු වෙන්නේ. ප්‍රතිසන්ධියෙදී ගත්ත අරමුණම තමයි භවාංගටත් අරමුණ වෙන්නේ. ප්‍රතිසන්ධියෙන් ගත්තු අරමුණම තමයි චුතියටත් අරමුණ වෙන්නේ. 'ප්‍රතිසන්ධි' 'භවාංග' 'චුති' වශයෙන් සිත් තුනක් උනාට ඒ සිත් තුනම ගත්ත ආරම්මණය එකයි. මේක

තේරෙනවද? ඒ අරමුණ එන්නෙත් විපාකයක් හැටියට. හැබැයි ප්‍රතිසන්ධි සිතේ තිබෙන අරමුණ නොවෙයි නිවන් දකිනකොට තිබෙන්නේ. නිවන් දකිනකොට මාර්ග සිතටත් ඵල සිතටත් අරමුණු වෙන්නේ නිර්වාණ ධාතුව. නිර්වාණ ධාතුව සංඛත අරමුණක් නොවෙයි. ඒක හේතුවකින් හට ගත්ත අරමුණක් නොවෙයි. ඒක අසංඛත අරමුණක්. මාර්ග සිතට අරමුණු වෙන්නේ හේතුවකට ඵලයකට අයිති නැති අසංඛත අරමුණක්.

අසංඛතය කියන්නේ හේතුවකින් හට නොගන්නා දේ. හේතුවකින් හටගත්ත දෙයට කියනවා සංඛතය කියලා. බලන්න දැන් මම මේ desk එක උඩින් යම්කිසි දෙයක් තබනවා. Desk එක සංඛතයක්. නමුත් එතන අසංඛතයකුත් තිබෙනවා. ඒ තමයි desk එකට උඩින් තිබෙන හිස් අවකාශය. ඒ අහස සංඛත නොවෙයි. අහස කියන එක හේතුවකින් හට නොගත් එකක් නිසා ඒක අසංඛතයි. නමුත් ඒක ලෞකිකයි. නිර්වාණ ධාතුවත් අසංඛතයි. නමුත් ඒක ලෝකෝත්තරයි.

'අවකාශය' 'ආකාසය' 'හිඩස' 'space' යන මේ නම් වලින් හඳුන්වන්නේ අසංඛත ධාතුවක්, නමුත් අහස දෙස බලන් හිටියට නිවන් දකින්නේ නෑ. ප්‍රඥාවෙන් අත් විඳිය යුතු අසංඛත ධාතුවක් තිබෙනවා. ඒ තමයි නිර්වාණ ධාතුව. එතකොට ලෞකික අසංඛත ධාතුවක් තිබෙනවා ලෝකෝත්තර අසංඛත ධාතුවක් තිබෙනවා. මේ ලෞකික අසංඛතය යම් යම් තැන් වලදී පාවිච්චි වෙනවා. රූප වලට, ඉන්න, වලාකුළු වලට පිහිටන්න මේ අසංඛතය පාවිච්චි වෙනවා. නිර්වාණ ධාතුවේ රූපත් නෑ, නාමත් නෑ, හිතුත් නෑ මොකක්වත් නෑ. ඒක නිසා මේ අහසින් කෙරෙන්නා වූ වැඩේ නොවෙයි එතැනින් කෙරෙන්නේ.

අපි නිවන් අවබෝධ කරගන්න වෙලාවේදී අපි අසංඛත ධාතුවක් අවබෝධ කරගන්නවා. සංඛත වස්තු ගොඩක් තිබෙන හින්දා සංඛත කෑලි වලට අපි වෙන වෙන නම් හයි කරලා තිබෙනවා. ඒවා දේවල්වලට හයි කරලා තිබෙන නිමිති. (උදාහරණ - පොත මේසය පෙට්ටිය) ඒ තමයි සංඛත දේවල් වලට හයිකරලා තිබෙන නාම කෑලි = ප්‍රඥප්ති.

එතකොට භවාංග සිතටත් අරමුණක් තිබෙනවා. ප්‍රතිසන්ධියටත් අරමුණක් තිබෙනවා. චුතියටත් අරමුණක් තිබෙනවා. මාර්ග සිතටත් අරමුණක් තිබෙනවා. ඵල සිතටත් අරමුණක් තිබෙනවා. භවාංගයට තිබෙන අරමුණ සංඛත අරමුණක් ද අසංඛත අරමුණක්ද? සංඛතයි. හේතුවකින් හට ගත්ත ලෞකික අරමුණක් තමයි භවාංගයට තිබෙන්නේ. මාර්ග සිතට තිබෙන්නේ හේතුවකින් හටගත්තේ නැති අසංඛතයක්.

දැන් රහතන්වහන්සේ රහත් භාවයට පත් උනහම උන්වහන්සේගේ භවාංග සිත වෙනස් වෙයිද? නෑ, රහතන්වහන්සේගේ භවාංග සිත වෙනස් වෙන්නේ නෑ. රහතන්වහන්සේගේ ක්‍රියත්මක වෙලා එන්නාවූ සිත් වල තිබෙන්නා වූ කෙලෙස් ගතිය නැති කරලා සම්පූර්ණයෙන්ම අනුශය කෙලෙස් විනාශ වෙන එකක් පමණයි සිදු උනේ. භවාංග සිත වෙනස් කරන එකක් නොවෙයි රහත් වෙනවා කියන්නේ.

දැන් මේ විදියට හිතන්න බලන්න. අපි හිතමු රහතන්වහන්සේගේ භවාංග සිත වෙනස් උනා කියලා. රහතන්වහන්සේගේ භවාංග සිත් වෙනස් උනා නම් ඒක ක්‍රියා සිතක් වෙන්න ඕනෑ. නැත්නම් මාර්ග සිතක් හෝ ඵල සිතක් වෙන්න ඕනෑ. එහෙමනම් උන්වහන්සේ යම්කිසි වේලාවක සැතපෙන කොට නිවන් දැක දැක ඉන්න ඕනෑ, නැත්නම් ක්‍රියා සිත් පහළ වෙන්න ඕනෑ. නමුත් ඒක නොවෙයි සිදු වෙන්නේ. රහතන්වහන්සේ නමක් සැතපුනහම පහළ වෙන්නේ භවාංග සිත්. උන්වහන්සේගේ ඉස්සරවෙලා ජීවිතියේදී කරපු කුසල විපාකයක වින්දනයක් උන්වහන්සේ කරන්නේ. රහතන්වහන්සේ නින්දෙන් අවදිවෙලා ඊට පස්සේ උන්වහන්සේ ඵල සිත් වලින් නිර්වාණය අරමුණු කරනකොට එතකොට ඵල සිත් පහළ වෙනවා. රහතන්වහන්සේ බණ දේශනා කරනකොට පහළ වෙන්නේ ක්‍රියා සිත්. රහතන්වහන්සේලාට කුසල් සිත් හෝ අකුසල් සිත් පහළ වෙන්නේ නෑ.

ඒක නිසා රහතන්වහන්සේට නිරෝධ සමාපත්තියට හෝ ඵල සමාපත්තියට සමවදින කොට පමණයි උන්වහන්සේට එයට ආදළ සිත් පහළ වෙන්නේ. උන් වහන්සේලාගේ භවාංග සිත වෙනස් වෙනවා නොවෙයි. එහෙම එක්ක කොහෙවත් සඳහන් කරලා නෑ. රහතන්වහන්සේට තිබෙන භවාංග සිතෙන් තමයි උන්වහන්සේගේ චිත්ත වීථි හටගන්නේ. දැන් අපිට පහළ වෙන චිත්ත වීථි තමයි කුසල් සිත්. රහතන්වහන්සේට පහළ වෙන්නේ ක්‍රියා සිත්. රහතන්වහන්සේ පිරිනිවන් පාන වේලාවේදී රහතන්වහන්සේටත් චුති සිතක් ඇතිවෙනවා. රහතන්වහන්සේට චුති සිතක් ඇති වෙනකොට ඒ ඇතිවෙන්නේ මාර්ග සිතක්ද ඵල සිතක්ද නැත්නම් භවාංග සිතක්ද? උන්වහන්සේටත් ඇතිවෙන්නේ භවාංග සිතක්. කවදාකවත් ඵල සිතක් චුති ක්‍රියාව කරන්නේ නෑ. ධ්‍යාන සිතුත් චුතිය කරන්නේ නෑ.

සූත්‍ර දේශනාවක තිබෙනවා මෙන්න මෙහෙම. **අපුබ්බං අචරිමං** කියලා. කෙලෙස් නැසීමත් සිද්ධ වෙනවා, පරිනිර්වාණයත් සිද්ධ වෙනවා පෙර පසු නොවී කියලා. ඕන්න ඕතැන තමයි සමහර අය අල්ලගෙන තිබෙන තැන, රහත්වෙන එකයි කෙලෙස් නසන එකයි දෙකම එකට සිද්ධ වෙනවා කියලා. දැන් චුත වෙනවා කියන එක මොකක්ද? චුත වෙනවා කියන එක විපාක සිතක්. එතකොට මාර්ග සිත අරමුණු වෙනවා නම් නිවන් අරමුණු වෙන්න ඕනෑ. එතකොට නිවන් දකින වැඩෙයි චුති වැඩෙයි සිද්ධ වෙයිද? නෑ එහෙම සිද්ධ වෙන්න බෑ. අන්න ඒ ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඒක නිසා අපුබ්බං අචරිමං කියලා කියන තැන එක සිතකම නොවෙයි නමුත් ඒ චිත්ත පරාසයේ පෙර පසු නොවී එක චිත්ත විථියක තමයි ඕක සිද්ධ වෙන්නේ. අරමුණු කළාවූ අරමුණෙන් නිවනුත් දකිනවා සහ ඒ එක්කම එයාගේ ජීවිතිය අවසන් වෙලා යනවා. අවසාන වෙනකොට අවසන් වෙන්නේ චුති සිතක් පහළ වෙලා.

<u>ප්‍රශ්නය</u> - ඒ කියන්නේ ස්වාමීන්වහන්ස අවසාන චිත්ත වීථියේදී නිවන අරමුණු කරලා ජවන් සිත් ඇතිවෙලා ඊළඟට චුති සිත ඇතිවෙනවා?

<u>ස්වාමීන්වහන්සේ</u> - දැන් ලොව්තුරා බුදුරාජාණන්වහන්සේ පරිනිර්වාණයට පත් උන තැන දන්නවද?

කුසිනාරානුවර උපවර්තන සල් උයනේ. බුදුරජාණන්වහන්සේ වැඩ හිටියේ සල්මල් ගස් දෙකක් යට. බෝධිසත්වයන් වහන්සේ උප්පත්තිය ලැබුවේ සල්මල් ගහක් යට. බුදුරාජාණන්වහන්සේ ධර්මය අවබෝධ කරගත්තේ බෝගහක් යට. බුදුරාජාණන්වහන්සේ පිරිනිවන් පෑවේ සල් ගසක් යට. නමුත් අනිත් ගොඩක් අය ඉපදිලා තිබෙන්නේ මොකක් හරි ෂීට් වහලයක් යට. නැත්නම් උළු වහලයක් යට. ගමේ නම් පිදුරු වහලයක් යට. ඇත්ත වශයෙන්ම සජීවීව පවතින වහලයක් යට නොවෙයි. ඒක නිසා ගසක් යට පහළ වී අවබෝධ කරගත් ඒ ධර්මය වහලවල් යට උපන්නාවූ අයට කියලා දෙනවා කියන එක හරි අමාරුයි.

උපවර්තන සල් උයනේ තමයි බුදුරජාණන්වහන්සේගේ පරිනිර්වාණය සිදුවෙන්නේ. ඒ තමයි geographically භූමි භාග වශයෙන් තිබෙන්නා වූ area එක. වස්තු මූලිකත්වය තමයි ඒ සල් ගස් දෙක. උන්වහන්සේ එතැන වැඩ ඉඳගෙන ඊට පස්සේ සමාපත්තියට සමවැදුනා. පළමුවෙන්ම උන්වහන්සේ ප්‍රථම ධ්‍යානයට සමවැදුනා. ඊළඟට පිළිවෙලින් දෙවෙනි ධ්‍යානයට තුන්වෙනි ධ්‍යානයට සතරවෙනි ධ්‍යානයට ආකාසානඤ්චායතනයට විඤ්ඤාණඤ්චායතනට ආකිඤ්චඤ්ඤායතනයට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සහ ඊළඟට නිරෝධ සමාපත්තියට සමවැදුනා. ස්ථාන අටක් පහුකරගෙන ගිහිල්ලා නිවනට සමවැදුනා. නැවතත් නිරෝධ සමාපත්තියෙන් බැසගෙන නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියා. එතැනින් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියටත් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියටත් ආකාසානඤ්චායතන සමාපත්තියටත් ඊළඟට නැවතත් සතරවෙනි ධ්‍යානයටත් තුන්වෙනි ධ්‍යානයටත් දෙවෙනි ධ්‍යානයටත් පළවෙනි ධ්‍යානයටත් පැමිණියා. ඊළඟට නැවතත් පිළිවෙලින් පළවෙනි ධ්‍යානයේ සිට සතරවෙනි ධ්‍යානයතෙක් සමවැදුනා.

බුදුරාජාණන්වහන්සේට තිබෙන්නේ සීහ ගති. සිංහයා හොඳට සීරුවෙන් ආපු තැන දිහා වටපිට බලනවා කියලා කියනවා. මොකක් හරි දෙයක් වැටුනොත් වැටිච්ච දේ ගැන නොවෙයි බලන්නේ ඒක ආපු තැනයි සිංහයා බලන්නේ. ඒක සිංහ ගතිය. ඒවගේ බුදුරාජාණන්වහන්සේත් යම් කිසි සිදුවීමක් සිදු උනහම ඒ සිද්ධ වෙච්ච දේට ළඟ හේතුව නොවෙයි බලන්නේ. අපි හිතමු මනුස්සයෙක් වැටෙනවා. වැටිලා තුවාල වෙනවා. අපි බලන්නේ ඒකට ළඟ හේතුව. එතැන ගලක් තිබුණා හෝ නැත්නම් කවුරුහරි එක්කෙනෙක් ලීයක් හරහට දාලා හෝ ඒක තමයි මේ මනුස්සයාට හේතු උනේ පාරේ වැටෙන්න කියලා. ඒවගේ අපි බලන්නේ ළඟ හේතු. නමුත් බුදුරාජාණන් වහන්සේගේ සීහ ගති නිසා බුදුරජාණන්වහන්සේ බලනවා මෙච්චර මිනිස්සු යන පාරේ මෙහෙම වැටෙන්න මෙයා කරලා තිබෙන කර්මය මොකක්ද කියලා උන්වහන්සේ පිටිපස්ස බලනවා. කෙනෙක් මෙතැනට ආවේ කොහෙන්ද කියලා පිටු පස බලනවා. ආන්න ඒවාට කියනවා සීහ ගති කියලා.

ඒවගේ බුදුරාජාණන් වහන්සේ ධ්‍යානයකට සම වැදීලා ඒ ධ්‍යානයෙන් එළියට වැඩම කරහම ඒ ධ්‍යානය ඇතුලේ තිබෙන්නාවූ ධර්ම ස්වභාවය හොඳට මෙනෙහි කරනවා, හිතනවා. ඒකට කියනවා ප්‍රත්‍යයවේක්ෂා කරනවා කියලා. විතර්කය විචාරය ප්‍රීතිය සුඛය ඒකාග්‍රතාව උපේක්ෂාව මෙනෙහි කරනවා. බුදුරාජාණන් වහන්සේගේ ඔය ගති තිබෙනවා. බුදුරාජාණන් වහන්සේ අවසාන වතාවට හතරවෙනි ධ්‍යානයට සමවදිනවා. සමවැදිලා එයින් එළියට එනවා. එළියට එනකොටම ධ්‍යානයේ තිබුණ අංග මෙනෙහි කරගෙන එන්නේ. ධ්‍යාන අංග සම්මර්ශනය කරලා ඉවරවෙනවත් එක්කම උන්වහන්සේ පිරිනිවන්පානවා. ආන්න ඒකට කියනවා බුදුරජාණන්වහන්සේගේ **චරිමක චිත්තය** කියලා. **චරිමක චිත්තය** කියලා කියන්නේ බුදුරාජාණන්වහන්සේගේ අන්තිම සිත.

බුදුරාජාණන් වහන්සේ මේ ජීවිතිය කෙලවර කරපු අවසාන චිත්තය තමයි **මෛත්‍රීය පෙරටු කරගත් සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික කියන මහා විපාක සිත**. ඒ සිත තමයි උන්වහන්සේට චුතියට පහළ වෙන්නේ ඒකත් එක්ක තමයි බුදුරාජාණන්වහන්සේ පිරිනිවන් පාන්නේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන අවස්ථාවේ චුති සිත හැටියට ඉදිරිපත් උනේ තුසිත දිව්‍යලෝකයේ ඉඳලා උන්වහන්සේ මහා මායා දේවියගේ කුසේ උපදිනකොට පහළ වෙන සිත. ඒ ප්‍රතිසන්ධි සිතට සමානයි උන්වහසේගේ ජීවිත කාලයේම පහළ වූ භවාංග සිත්. ඒ සිතෙන්ම තමයි උන්වන්සේ පිරිනිවන් පාන්නේත්.

බුදුරජාණන් වහන්සේ මනුස්ස ලෝකයේ උපදින්නේ මෛත්‍රී සහගත හැඟීමෙන්. දෙවියෝ ආරධනා කළා ‘ඔබවහන්සේ උපදින්න ලොව්තුරා බුදුවෙන්න, දැන් කාලේ හරි’ කියලා. ඊට පසේ උන්වහන්සේ ‘මගෙන් ලෝකයාට පිහිටක් වෙන්න ඕනෑ’ කියන හිතෙන් තමයි එන්නේ. ආන්න ඒ හිත තමයි උන්වහන්සේට මේ චුති සිද්ධියට චරිමක සිත හැටියට ක්‍රියාත්මක උනේ. රහතන් වහන්සේලාටත් එහෙමයි. ලොව්තුරා බුදුරාජාණන් වහන්සේ හතරවෙනි ධ්‍යානයට වැඩම කළ එක හැබැව මනසින් නමුත් හතරවෙනි ධ්‍යානයෙන් එහෙම්ම ගියා ගියා නොවෙයි. උන්වහන්සේ එතැනින් එළියට එනකොටම තමයි අර මනසිකාරයත් එක්ක පිරිනිවන්පෑවේ. බුදුරජාණන්වහන්සේ භවාංග සිත චුති චිත්තය වෙනවා. නමුත් මාර්ග සිත චුති සිත වශයෙන් වැඩ කරන්නේ නෑ.

<u>ප්‍රශ්න</u> - ස්වාමීන්වහන්ස බුදුරාජාණන් වහන්සේ පිරිනිවන්පාන්න ඉස්සෙල්ලා හතර වෙනි ධ්‍යානයට සමවැදීලා ඊට පස්සේ ....?

<u>පිළිතුර</u> - බුදුරජාණන්වහන්සේ හතරවෙනි ධ්‍යානයට ඇතුලට ගියා. හතරවෙනි ධ්‍යානය ඇතුලට ගිහිල්ලා හතරවෙනි ධ්‍යානය දිහා බලලා තමයි වැඩම කළේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එහෙම හතර වෙනි ධ්‍යානයට සමවදින්න විශේෂයක් තිබෙනවද?

<u>පිළිතුර</u> - . මෙහෙම එකක් තිබෙනවා. හතරවෙනි ධ්‍යානය center එකක්. ඒක මධ්‍යස්ථානයක්. ඒකට කියනවා **ආනෙඤ්ජ** කියලා. ආනෙඤ්ජසප්පාය සූත්‍රය කියලා සූත්‍රයක් තිබෙනවා. ආනෙඤ්ජසප්පාය සූත්‍රයේ දේශනා කරන්නෙත් හතරවෙනි ධ්‍යානය ලබා ගන්න පිළිවෙලක්.

අනිත් එක තමයි තැන් තැන් වල shopping mall වල supermarket වල කඩල හප හපා යන අයට සතර වෙනි ධ්‍යානය ලැබෙන්නේ නෑ. මේක හොඳට තේරුම් ගන්න. ඒකට කැප වෙන්න ඕනෑ. නමුත් හතර වෙනි ධ්‍යානය හම්බ නොවී තිබෙන්නෙත් නෑ. ධ්‍යානය ලැබෙනවා. උත්සාහයක් දරන්න ඕනෑ. ඒක නිසා බුදුරාජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාටත් කියලා තිබෙන්නේ 'මහණෙනි අරණ්‍ය සේනාසන තිබෙනවා රුක්ෂ මූල තිබෙනවා ඒවාට ගිහිල්ලා භාවනා කරන්න, ධ්‍යාන වඩන්න පස්සේ තැවෙන්න එපා' කියලයි. භික්ෂූන් වහන්සේලාටත් කිව්වේ වැඩිය කථා කරන්න එපා, පාඩුවේ පැත්තකට වෙලා නිස්සංකලව මේක කරන්න කියලා. ඒකයි හාමුදුරුවරු මිනිස්සුන්ගෙන් අයින් වෙලා වනාන්තර ගතවෙලා කැළෑ වල විවේක ස්ථාන වල වැඩ ඉන්නේ. හිත සමාධි කරගන්න අමාරුයි.

ඊළඟට නගරයේ ඔය වැඩේ හාමුදුරුවෝ කෙනෙකුටත් කරන්න අමාරුයි. හැබැයි ගිහි පින්වතුන්ට බැරි කමකුත් නෑ. ගිහි පින්වතුන් හාමුදුරුවරු වගේ නොවෙයි. ගිහි පින්වතුන් ගෙදරට යනකොටම යාළු කෙලෙස් ටික බලාගෙන ඉන්නේ ගිල ගන්න. ඒක නිසා හතර වෙනි ධ්‍යානය කෙසේ වෙතත් උපචාර අවස්ථාවක් හදාගන්න පුළුවන් නම් ඒකත් තෑගි දිය යුතු කාරණාවක්. මම ගිහිල්ලත් තිබෙනවා සමහර සුදු අයගෙ ගෙවල් තිබෙනවා ඇත්තටම ආරණ්‍යයක කුටියක් වගේ. බල්ලෙක් බුරන හඬක්වත් නෑ. කිසිම සද්දයක් නෑ හරිම ශාන්තයි. අපේ ධම්ම ගවේශියත් තිබෙන්නේ හරිම නිස්කලංක පරිසරයක. ඒවගේ ගෙවල් තිබෙනවා. ඒවගේ තැන්වල නම් පුළුවන්. එහෙම නැතුව මේ කලබගෑනි තිබෙන තැන් වල කරන්න බෑ.

හතරවෙනි ධ්‍යානය කියලා කියන්නේ හරිම වටිනා තැනක් මානසික වශයෙන්. හේතුව එතැන සැපට දුකට බර වෙන්නේ නෑ. ඒක උපේක්ෂා සහගතයි. ඒ උපේක්ෂා සහගත ගතිය හරි වටිනවා. අපිට උපේක්ෂාව නැති හින්දා තමයි මොකක් හරි වෙනකොට දුවලා පැනලා කලබල වෙන්නේ. හැබැයි අපි උපේක්ෂාව හිතල හරි හදාගන්න ඕනේ. හතර වෙනි ධ්‍යානයට යනකම්වත් සාමාන්‍යයෙන් කර්මය කර්ම ඵලය හිතලවත් උපේක්ෂාව හදාගන්න ඕනේ. උපේක්ෂාව නැත්නම් එහෙම අපේ හිත කලබල වෙනවා. ඒක හොඳ නෑ. හතරවෙනි ධ්‍යානය උපේක්ඛා සහගතයි. සැප දුක් විරහිතයි. ඒක නිසා සංඥාව ලේසියෙන් ගන්න පුළුවන්. දැන් ආකාසානඤ්චායතනය කියලා කියන්නේ හතරවෙනි ධ්‍යානය නමුත් තිබෙන්නේ වෙනස් කරපු සංඥාවක්. ධ්‍යාන level එක හතරවෙනි ධ්‍යානය. සංඥාව අරූපාවචර.

රූපාවචර හතරවෙනි ධ්‍යානයේදී අරමුණ මොකක්ද? අරමුණ රූපාවචරයි. ඊළඟට ආකාසානඤ්චායතනයෙන් යනවා විඤ්ඤාණඤ්චායතනයට. ඒ කියන්නේ හතරවෙනි ධ්‍යානයේ level එක අරමුණ විඤ්ඤාණය. ආන්න ඒ වගේ අරමුණු වෙනස් කරන්න පුළුවන් හතරවෙනි ධ්‍යානයට ගියහම. ඒකයි බුදුරජාණන්වහන්සේ හතරවෙනි ධ්‍යානය ඒ තරම්ම වැදගත්කොට දේශනා කරලා තිබෙන්නේ.

ආකාසානඤ්චායතනයට යනවා කියලා කියන්නේ විඤ්ඤාණඤ්චායතනයට යනවා කියලා කියන්නේ ආකිඤ්චඤ්ඤායතනයට යනවා කියන්නේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට යනවා කියලා කියන්නේ අරූපාවචර සංඥා හතරක් හදාගන්නවා කියන එකයි.

<u>ප්‍රශ්නය</u> - විඤ්ඤාණඤ්චායතනය කියන තත්වය කියන එක විඤ්ඤාණය අරමුණු කර ගත්ත එකක්ද?

<u>පිළිතුර</u> - ඒ කියන්නේ දැනට තිබෙන විඤ්ඤාණය නොවෙයි. හතරවෙනි ධ්‍යානයෙන් අකාසයට හරවලා ගත්ත විඤ්ඤාණය. මේක හොඳටම තේරුම් කරගන්න ඕනෑ.

මනුස්සයෙන් විස්තර කරන්න කියලා කියනවා. මනුස්සයෙක් හඳුනා ගන්න ක්‍රම දෙකක් තිබෙනවා. ශරීර අංග වශයෙන් ගත්තම ඔළුව කලුයි, කෙට්ටුයි උසයි කියලත් මනුස්සයෙක් හඳුනා දෙන්න පුළුවන්. තව තිබෙනවා රතුපාට shirt එකක් ඇඳලා හිටපු එක්කෙනා නිල් පාට jacket එකක් ඇඳලා හිටපු එක්කෙනා කියලත් හඳුන්වා දෙන්න පුළුවන්. මේවා ශාරීරික අංග නොවෙයි. ඒවා ඇඳ පැළඳගෙන ඉන්න ඒවා. නමුත් මීට වෙනස් ආකාරයටත් මනුස්සයෙක් හඳුනා දෙන්න පුළුවන්. ඒ තමයි 'හරි කරුණාවන්තයි, නැත්නම් 'අර හැම වෙලේම ඔරවන එක්කෙනා' 'අර හැමදාම දානේ දෙන එක්කෙනා' කියලා හඳුනා දෙන්නත් පුළුවන්. මෙයිට වඩා තවත් ක්‍රම වලට මිනිස්සු හඳුනා දෙන්න පුළුවන්.

ධ්‍යාන අටක් තිබෙනවා. 'ප්‍රථම ධ්‍යානය' 'ද්විතිය ධ්‍යානය' 'තෘතිය ධ්‍යානය' 'චතුත්ථ ධ්‍යානය' 'ආකාසානඤ්චායතනය' 'විඤ්ඤාණඤ්චායතනය' 'ආකිඤ්චඤ්ඤායතනය' 'නෙවසඤ්ඤානාසඤ්ඤායතනය' කියලා. 'පළවෙනි ධ්‍යානය' 'දෙවෙනි ධ්‍යානය' 'තුන්වෙනි ධ්‍යානය' 'සතර වෙනි ධ්‍යානය' හඳුන්වන්නේ ඒ ධ්‍යාන අස්සේ තිබෙන අංග වශයෙන්. මොනවාද මේ ධ්‍යාන අංග? විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතාව සහ උපේක්ඛාව.

අපි පළවෙනි ධ්‍යානය හඳුන්වන්නේ විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා ඇති ප්‍රථම ධ්‍යානය කියලා. දෙවෙනි ධ්‍යානය හඳුන්වන්නේ ප්‍රීති සුඛ ඒකග්ගතා තිබෙන දෙවෙනි ධ්‍යානය කියලා. ඊළඟට සුඛ ඒකාග්‍රතා තිබෙන තුන්වෙනි ධ්‍යානය. උපේක්ඛා ඒකග්ගතා සහිත හතරවෙනි ධ්‍යානය. දැන් මේ පින්වතුන්ට තේරෙනවා නේද මේ ධ්‍යාන හතර කියලා දුන්නේ ඒකෙ තිබෙන කෑලි ටිකක් එකතු කරගෙන බව.

දැන් යන්න බලන්න ආකාසානඤ්චායතනයට. ආකාසානඤ්චායතනය කියලා කියන්නේ ඒ ධ්‍යානයෙන් අරමුණු කරන්නා වූ අරමුණේ හැටියටයි. ඒකෙදි කියන්නේ අංග හැටියට නොවෙයි ඒකෙ තිබෙන අරමුණේ හැටියටයි. ඒ පළවෙනි ධ්‍යානයේ අරමුණ 'ආකාසය'. දෙවෙනි ධ්‍යානයේ අරමුණ 'විඤ්ඤාණය'. තුන්වෙනි ධ්‍යානයේ (ආකිඤ්චඤ්ඤායතනය) අරමුණ 'කිසිවක් නෑ කියලා හැඟීම ගන්න එක'. හතරවෙනි ධ්‍යානය එනම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයේ අරමුණ 'සංඥාවක් ඇත්තෙත් නෑ නැත්තෙත් නෑ' කියලා ගන්න එක.

දැන් තේරෙනවා නේද මේ ධ්‍යාන 8 න් පළවෙනි ධ්‍යාන හතර හඳුන්වා දෙන්නේ ධ්‍යානයේ ඇතුලේ තිබෙන්නා වූ අංග උපාංග එක්ක. නමුත් 5, 6, 7 සහ 8 කියන අරූපාවචර ධ්‍යාන හඳුන්වා දෙන්නේ ඒවාට අරමුණු වෙන්නා වූ ධර්ම කරුණු අරගෙන. පළවෙනි ධ්‍යාන 4 ගැන ප්‍රශ්නයක් නෑ. දැන් මේ පින්වතුන්ට ප්‍රශ්නය තිබෙන්නේ 5 වෙනි 6 වෙනි 7 වෙනි 8 වෙනි ධ්‍යාන ගැන.

ආකාසය කියලා කියන්නේ, අපි ආකාස සංඥාවක් ගන්නවා. අහස කියන සංඥාව අරගෙන ඒ අහස කියන සංඥාවට හිත තබනවා. ඒක හතරවෙනි ධ්‍යානය මුල් කරගෙන කරන්නේ. අහස කියන සංඥාව ඒ කියන්නේ මොකක්වත් නෑ, තිබෙන්නේ අහස පමණයි කියලා ධ්‍යානය අස්සට ගිහිල්ලා මෙනෙහි කිරීම තුලින් තමයි ඒ ආකාස සංඥාව එන්නේ. නැත්නම් එළියේ තිබුණ සංඥාවක් නොවෙයි ගන්නේ. ඒ ආකාස සඥාව ගත්තයින් පස්සේ අහස කියන සංඥාව දැන ගන්න හිතක් තිබෙන්න ඕනෑ. ඒ අහස කියන සංඥාව තමයි ධ්‍යාන අරමුණ. ඒ අහස කියන සංඥාව දැන ගන්න හිත තමයි ධ්‍යාන හිත. මේ ධ්‍යානයේ අරමුණ තමයි අහස කියන සංඥාව. ඒක අරූපාවචරයි. අහස කියන්නේ මොකක්වත් නෑ කියන එක.

දැන් මේක ටිකක් අමාරුයි. අහස කියන සංඥාව දැන ගන්න හිතක් තිබෙන්න ඕනෑ. හැම තැනම අහස, දකුණු පැත්තෙත් අහස, උඩත් අහස, යටත් අහස වෙන මොකක්වත් නෑ. හැම තැනම තිබෙන්නේ අහස. දැන් මෙයාගේ හිත පිරිලා තිබෙන්නේ අහස කියන එකම සංඥාවෙන්. මල් ගහක් දෙල් ගහක් පොල් ගහක් ගැන මොකක්වත් මතකයට එන්නේ නෑ. ඒ අහස කියන එක දැනගන්න පුළුවන් කම තිබෙන්නේ හිතන හිතන හැම පැත්තෙන්ම අහස කියලා දැන ගන්න පුළුවන් විදියට පැතිරිලා විසාල වෙලා තිබෙන හිත නිසා. එහෙම හිතක් නැත්නම් අහස කියන සංඥාව දැන ගන්න පුළුවන්ද? බෑ. ආන්න ඒක නිසා දෙවෙනුව එයා කරන්නේ 'මේ අහස කියන සංඥාව දැන ගත්තේ මෙන්න මේ සිතෙන්, අහස යම් කිසි ගමක් විතර ලොකුයි නම් ඒ ගමක් විතර ලොකු අහස දැන ගන්න ගමක් විතර ලොකු හිතක් තිබෙන්න ඕනෑ, අහස ලෝකයක් තරම් නම් ඒ තරම්ම ලොකුවට තිබෙන්න ඕනෑ දැනගන්න සිත' කියලා පස්සේ එයා කරන්නේ 'මේ අහස කියන එක දැන ගත්තේ ඒ අහස ගැන දැන ගන්න සිතක් තිබුණ නිසයි, ඒක නිසා අහසක් නෑ, ඒ අහස ගැන දැන ගන්නා වූ සිතක් විතරයි තිබෙන්නේ' කියලා විඤ්ඤාණයටම හිත හරවනවා. ඒකට කියනවා විඤ්ඤාණඤ්චායතනය කියලා.

මේක තේරුණාද? නෑ ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නය</u> - තමන් තුල තිබෙන විඤ්ඤාණයද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව් තමන්තුළ තිබෙන විඤ්ඤාණය එතැනට වෙනස් වෙලා තිබෙන්නේ. තමා තුල තිබෙන හිත අහස දකිනවා. ඒක හැම තැනම තිබෙන විඤ්ඤාණ නොවෙයි. ඔය අපි දන්න චක්ඛු විඤ්ඤාණය සෝත විඤ්ඤාණය නොවෙයි.

<u>ප්‍රශ්නය</u> - අහස කියලා කියන්නේ emptiness ද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - Emptiness කියන එක මහත්තයා පාවිච්චි කරන්න හොඳ නෑ මේ වගේ තැන් වලදි. Space එක කියලා කියන්න ඕනෑ.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස අපේ අවබෝධයේ හැටියට විඤ්ඤාණය කියලා කියන එක අරමුණක් නැතුව පහළ වෙන්නේ නෑ.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව්, පහළ වෙන්නේ නෑ. දැන් වැඩිය දුර යන්නේ නැතුව බලන්න, මෙතැන අහස කියලා එකක් ළඟ තිබෙනවද ඇත්තටම? තිබෙනවා.

ඒක තිබෙන බව දැනෙනවාද? දැනෙනවා

ඒක දැනෙන්නේ ඇසටද කනටද නාසයටද හිතටද කයටද මොකකටද? හිතටයි දැන්නේනේ. කවදාකවත් අහස පේන්නේ නෑ. අපි අහස පේන්නේ නැති නිසා 'මෙන්න මේක තමයි අහස කියන්නේ' කියලා හිතෙන් අරමුණු කරනවා. ඒ අහස කියන එක හිතෙන් අරමුණු කරන්න පුළුවන්. ඒ උනාට ඒක කොහොමද කරගන්නේ කියලා කියා ගන්න බැරි එකයි ප්‍රශ්නය. ඒකට භාෂාව දාගන්න බෑ. නැත්නම් හැම වේලාවේම අහස තියෙනවද කියල ඇහුවහම 'තියෙනවා' කියලා කියනවා. අහස කියන එක හිතට දැනිච්ච හින්දයි එහෙම කියන්නේ. දැන් කිසිම වස්තුවක් නැති තැන අපි හිතෙන් හිතා ගන්නවා අහස කියලා. ඒක හරි ලේසියි. හැබැයි ඒ අහස කියන එක අරමුණු කරන්න හිතක් තිබෙන්න ඕනෑ. ඒ අහස කියන කොටස අරමුණු කරන හිතක් තිබෙනවා. ඒක නිසා ඊළඟට අපි ඒ අහස කියන එක අරමුණු කරපු 'හිත' අරමුණු කරනවා. ඒකයි විඤ්ඤාණය කියලා කියන්නේ.

<u>ප්‍රශ්නය</u> - ඒ කියන්නේ ස්වාමීන්වහන්ස අහස අරමුණු කරලා අපි වෙන සිතකින් දැනගන්නවා අහස කියලා එකක් ඇත්තටම නෑ, ඒක අපේ හිතෙන් දැන ගත්ත එකක් කියලා.

<u>පිළිතුර</u> - අහස කියලා එකක් තිබෙනවා. අහස කියලා ධාතුවක් තිබෙන නිසා තමයි හිතෙන් දැන ගත්තේ. ඊට පස්සේ සංඥාව මාරු කරනවා. මාරු කරනවා කියලා කියන්නේ අහස කියන එක දැන ගත්තේ ඇත්තටම මේ හිතින් නිසා ඊළඟට ඒ 'හිත' අරමුණු කරනවා. ඒ අහස කියන එක දිව්‍යලෝක හයක් විතර ලොකුයි නම් ඒ තරම්ම ප්‍රමාණයකට දුවවන්න පුළුවන් ලොකු හිතකුත් තිබෙන්න ඕනෑ. ඒක නිසා මේ ඔක්කෝම දැන ගන්නේ මේ 'හිත' තමයි කියලා ඒ විඤ්ඤාණය පැත්තට හැරෙනවා. ඊට පස්සේ ඒ විඤ්ඤාණය අරමුණු කරගෙන භාවනා කරනවා. 'ඇත්තටම මොන දේ කරත් දැනෙන්නේ විඤ්ඤාණයට' කියලා ඒ විඤ්ඤාණය මෙනෙහි කරනවා. එතකොට අහස කියන එක අමතක වෙලා ගිහිල්ලා විඤ්ඤාණයට හැරෙනවා. එතකොට හැම තැනම තිබෙන්නේ විඤ්ඤාණය. අහසට හැරෙව්වත් විඤ්ඤාණය, වලාකුළු වලට හැරෙව්වත් විඤ්ඤාණය, විඤ්ඤාණයට හැරෙව්වත් විඤ්ඤාණය.

මේක හොඳට පුරුදු කරලා පුරුදු කරලා මේක හොඳට තර වෙනවා. ඊට පස්සේ මොකක් හිතුනත් 'මේ දැනුනේ විඤ්ඤාණයට, දැනගැනීමේ ගතිය පමණයි මේ

විඤ්ඤාණයට තිබෙන්නේ ඊට වඩා දෙයක් නෑ' කියලා මෙයා ඔය විදියට විඤ්ඤාණය බලාගෙන බලාගෙන යනවා. ඔහොම බලාගෙන බලාගෙන ගිහිල්ලා ඊට පස්සේ එයා හිතනවා 'මේ විඤ්ඤාණයත් ඇත්තට මේ විදියටම තිබෙනවද? විඤ්ඤාණය කෝ? මම මේ විඤ්ඤාණය කියලා එකක් ගත්තට එහෙම එකකුත් නෑ' කියලා ඊට පස්සේ 'කිසිවක් නෑ' කියලා ගන්නවා. ඊට පස්සේ 'කිසිවක් නෑ' කියලා ගත්ත ඒ අරමුණ වැඩි කර ගන්නවා. එතකොට තමයි ආකිඤ්චඤ්ඤායතනය ඇති වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස විඤ්ඤාණය ධාතු වශයෙනුත් තිබෙනවා නේද?

<u>පිළිතුර</u> - තිබෙනවා, ඒක මෙහෙමයි මහත්තයා අපි ධර්මය දැන ගන්න ඕනෑ ඒවගේම ඒ ධර්මයන් ලක්ෂණත් එක්ක වෙන වෙනම දැන ගන්න ඕනෑ. අපි ගොඩක් කියවනවා. එතකොට එකතැනක කියනවා ආයතනය, එක තැනක කියනවා ධාතු වශයෙන්, එකතැනක කියනවා ඉන්ද්‍රිය කියලා. අපි වඩේ එකක් කනකොට ඒකෙ පරිප්පු බැදිලා තිබෙනවා. උම්බලකඩ කැලිත් පොඩ්ඩ පොඩ්ඩ තිබෙනවා. ඊළඟට ඕකේ දර කැලිත් තිබෙනවා. කුරුඳු කැලිත් තිබෙනවා. එතකොට අපි උම්බලකඩ කැල්ල උම්බලකඩ කැල්ල හැටියට හිතා ගන්න ඕනෑ. දර කැල්ල දර කැල්ල හැටියට හිතා ගන්න ඕනෑ. කඩල ඇටය බැදිලා හයිය උනාට ඒක දර කැල්ලක් නොවෙයි ඒක කඩල කියලත් තේරුම් ගන්න ඕනෑ. ඒවගේ ධර්ම ධාතු, ධාතු ස්වභාව හැටියට ගන්න ඕනෑ. ආයතන, ආයතන හැටියට ගන්න ඕනෑ. ආරම්මණය, ආරම්මණය හැටියට ගන්න ඕනෑ. ඒ ධාතු ස්වභාව ගැන මේ වෙලාවේ නැතුව වෙනමම කිව්වොත් තමයි හොඳ. ඒකට හේතුව පටලැවෙන නිසා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස නිරෝධ සමාපත්තියේදී භවාංග සිත...?

<u>පිළිතුර</u> - නිරෝධ සමාපත්තියේදී මහත්තයා භාවංග සිතත් නෑ. නිරෝධ සම්පත්තිය භවාංග සිතක් කියලා කිව්වොත් නින්දට සමාන වෙනවා. මොකද අපි නිදාගත්තම තිබෙන්නේත් භවාංග සිත. නිරෝධ සමාපත්තියට සමවැදුනහම ශාරීරික වශයෙන් ආයුෂය තිබෙනවා (ජීවිත ඉන්ද්‍රිය) උෂ්ණය තිබෙනවා, එච්චරයි. ආශ්වාස ප්‍රාශ්වාස නවතිනවා. හිතත් නෑ. භවාංගෙත් නෑ. නිර්වාණය අරමුණු කරන්නාවූ හිතකුත් නෑ. නිර්වාණය අරමුණු කරන සිතක් තිබුණා නම් ඒක ඵල සිතක් වෙනවා. ඒ ඵල සිතත් නෑ. එතැනදී සම්පූර්ණ හිතත් නැවතිලා. වේදනාවත් නැවතිලා. සංඥාවත් නැවතිලා. නාම ධර්ම ඔක්කොම disappear උනා වගේ වෙනවා.

නිරෝධ සමාපත්තියෙන් නැවත එනවා කියලා කියන්නේ ආපහු සිත activate වෙනවා. ඒක තමයි නිරෝධ සමාපත්තියෙන් එළියට ආවා කියලා කියන්නේ. නිරෝධ සමාපත්තියේ විඤ්ඤාණයක් කොහෙත්තම නෑ.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස අසංඥ තලයේදී?

<u>පිළිතුර</u> - අසංඥ තලයෙත් හිත නෑ. විඤ්ඤාණයත් නෑ. වේදනාවත් නෑ. විඳින්න කෙනෙකුත් නෑ. ජීවිත ඉන්ද්‍රිය ස්වරූපය තිබෙනවා එතැන. හැබැයි කෙලෙස් නසලා නෑ.

යම් කිසි වෙලාවක එයා එතැනින් අයින් වෙච්ච ගමන්ම නැවත activate වෙන්න ඇතුලේ energy තියාගෙන ඉන්නේ. මේක හරි පුදුම වැඩක්.

සත්වයෝ සත්වයෝ කියලා හිටියට මේවා විඤ්ඤාණ ගුලි. ඇත්ත වශයෙන්ම energy sets තිබෙන්නේ. අපි මේ කරන්නේ ලේසි වැඩක් නොවෙයි. මේ සිත් ටික ඔක්කොම එක පැත්තකට හරවාගෙන පරෙස්සමෙන් ඒවගේ තිබෙන negative energy upload වෙන්න නොදී smoothly මේක ගෙනියනවා කියන එක හරි අමාරු වැඩක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් ඔබ වහන්සේ කිව්වා ප්‍රතිසන්ධි සිතට අරමුණු වෙන එකයි චුති සිතට අරමුණු වෙන එකයි දෙකම එකයි කියලා. එතකොට ස්වාමීන්වහන්ස අපි කුසල කර්ම කරනකොට ඊළඟ භවයේ උපදිනකොට ගති නිමිති වෙනස් වෙන්නේ කොහොමද?

<u>පිළිතුර</u> - ඒ ගති නිමිති වෙනස් වෙන්නේ මරණාසන්න අවස්ථාවේදී අපිට මරණාසන්න චිත්ත වීථි කියලා එක්තරා pattern එකකට යන සිත් පෙළවල් පහළ වෙනවා. ඒ මරණාසන්න චිත්ත වීථි අරමුණු කරනවා භවාංගය අරමුණු කරන්නේ නැති වෙනත් අරමුණක්. අපි ඉස්සෙල්ලා හරි ළඟ පහතක හරි කරපු එකක් මරණාසන්න චිත්ත වීථි වලින් අරමුණු කරනවා. හැබැයි ඒ භවාංගයේ අරමුණ නොවෙයි. ඊට පස්සේ අපි භවාංගයට අරමුණු වෙලා තිබෙන්නාවූ අරමුණ චුතියත් එක්කම ගලවලා අයින් කරන කොටම අර ළඟදී ගත්ත අරමුණේ එල්ලෙනවා. එහෙමයි වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස ළමයෙකුට මව් කුසේදි භවාංග සිතක් තිබෙනවද?

<u>පිළිතුර</u> - තියෙනවා, කෙලින්ම ප්‍රතිසන්ධිය ගත්ත ගමන්ම දෙවෙනි සිතේ ඉඳලා යන්නේ භවාංග. හැබැයි එයාට මතක් වෙනවා කලින් හිටපු තැන. 'මම මැරෙන්න ඇති, මට මොකක් හරි උනා' කියලා ඒ වගේ සිතුවිලිත් පහළ වෙනවා. ඊට පස්සේ නැවත භවාංග වෙනවා. කළල අවස්ථාවේදීත් භවාංගම විතරක් නොවෙයි පහළ වෙන්නේ, අනෙකුත් සිතුත් පහළ වෙනවා. නමුත් වැඩි පුර පහළ වෙන්නේ භවාංග.

අපි හිතමු අම්මා උණුවතුර නානවා කියලා. ඒක දරුවට දැනෙනවා. උෂ්ණය දැනෙනවා. සීතල දැනෙනෙවා. ප්‍රතිසන්ධිය ගත්තු ගමන්ම වගේ ඒ දරුවට මතක් වෙනවා 'මම අහවල් තැන හිටියා මොකක්ද මට මේ උනේ' කියලා. සමහර වෙලාවට හොඳට මතක් වෙනවා මරණයට පත්වෙලා තිබෙනවා කියලා නමුත් ආයිමත් නින්ද යනවා නැවතත් ඇහෙරනවා මතක් වෙනවා. ඔය වගේ තමයි වෙන්නේ. නින්දට යනවා පොඩ්ඩක් ඇහැරෙනවා. ඔය වගේ වෙලා ඊට පස්සේ නින්ද වැඩි කම නිසා අරටික අමතක වෙලා යනවා.

ඊට පස්සේ ශරීරය ටිකක් ඖලාරිකව හැදිලා එනකොට එහෙට මෙහෙට අත සොලවන්න පටන් ගත්තට පස්සේ ස්පර්ශය දැනෙන්න පටන් ගන්නවා. ඔය විදියටයි වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - කන් හැදුනහම කනට ඇහෙනවද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඇත්ත වශයෙන්ම කනට ඇහෙන්න නම් දෝංකාරයක් ඇතිවෙන්න ඕනෑ හැබැයි කනට ශබ්දය එන්න වායුව ඕනෑ. නමුත් දෙදරුම් කනවා වගේ එකක් දැනෙන්න පුළුවන්. දැන් අපි වතුරකට බැහැල ඉන්දෙද්දී එළියේ කවුරුහරි කථා කරනකොට ඒවා ඩොග් ඩොග් ගාලා තමයි අපිට ඇහෙන්නේ. බඩේ ඉන්නකොට කන් හැදුනට අන්න ඒ වගේ ස්වරූපයකින් සංවේදී වෙන්න පුළුවන්. හරියට හඳුනා ගන්න නම් කන් වලට හුළඟ යන්න ඕන.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ජීවිතයෙන් ජීවිතයට යනකොට භවාංග චුති ඊළඟට ප්‍රතිසන්ධියක් ගන්නකොට ඒ ගත්ත අරමුණේ තිබෙන quality එකට අනුව ඒ කියන්නේ පව් හරි පිං හරි අනුව තමයි ඊළඟ ජීවිතියේ භවාංගය දිගටම ගෙනියන්නේ?

<u>පිළිතුර</u> - ඔව් ඊට පස්සේ භවාංගයට සීල් එක ගැහුවා වගේ ප්‍රතිසන්ධියට හදලා දෙනවා කර්ම නිමිත්තක් ගති නිමිත්තක් මොකක් හරි එකක්. ඒක තමයි දිගටම අල්ලාගෙන යන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දුටුගැමුණු රජ්ජුරුවන්ට අච්චර පිං තිබිලා අන්තිමට තරහ සිතක් ඇවිල්ලා පිඹුරෙක් උනා. ඒ රජ්ජුරුවෝ කරපු හොඳ විපාක ලැබුණේ ඊට පස්සේ ආත්මයක නේද?

<u>පිළිතුර</u> - ඒකට හේතුව ළඟම හිටිය කෙනෙක් පවන් ගැහුවා කියනවා. එතකොට නුරුස්නා ගතියක් ඇති උනාලු. ඒකෙන් තමයි පිඹුරෙක් වෙලා තිබෙන්නේ. හැබැයි වැඩි කාලයක් හිටියේ නෑ. මිහිඳු මහා රහතන්වහන්සේ වැඩම කරලා බේරා ගත්තා.

මෙහෙම එකක් මට කියන්න පුළුවන්. ඒ තමයි අපි හැම එක්කෙනෙක්ම සත් පුරුෂයෝ වෙන්න ඕනෑ. අපි ඉතින් මෙහෙ භාවනා වැඩ සටහනුත් කරගෙන යනවා. භාවනා කරලත් තිබෙනවා. ඔය අසත් පුරුෂ ආශ්‍රය තිබෙනවා නම් පුළුවන් තරම් ඒකෙන් අයින් වෙන්න. තමන්ගේ හිත නරක් වෙන තමන්ගේ හිතට ගැටීමක් ඇතිකරන කෙනෙක් ඉන්නවා නම් පුළුවන් තරම් අයින් වෙන්න. අයින් වෙලා හිත පරෙස්සම් කරගන්න. දාන මාන පිංකම් සීල භාවනා පිංකම් ලොකු වෙන්නේ මිනුස්සු ගොඩ ගහගන්න තරමට නොවෙයි. සමහර තැන් වල තිබෙන දානමය පිංකම් party events විතරයි. ඒවායේ දාන හරියට වෙන්නේ නෑ. ඒවා අසත්පුරුෂ දානත් වෙනවා. හේතුව ඒවායේ quality නෑ. ඒකට හේතුව අසත්පුරුෂ අය ලං කරගත්ත හින්දා. ඒ අය සතුටු කරන්න බැඳී ඉන්න නිසා. තමන් සත්පුරුෂයෙක් වෙන්න ඕනෑ අනිත් එක්කෙනාට. ඒ අය එනවා නම් ඒ අයට කියන්න ඕනෑ, බණ ටිකක් අහන්න, දානේ බෙදන්න උදව් වෙන්න එන්න කියලා. උයන්න පිහන්න සම්මාදම් උනේ නැති උනත් හදපු එකක් බෙදන්න වතුර එකක් අල්ලන්න එන්න කියන්න ඕනෑ. ෆොටෝ ගහන්න ඕනෑ නෑ කියලා කියන්න.

අසත් පුරුෂ බාලයෝ එක්කාසු කරගත්තම ඒ ගොල්ලන්ගේ ආශ්‍රය නිසා ඒ ගොල්ලන්ගේ ආශ්‍රයේ ඉඳීම නිසා ගත්තු අරමුණු තමයි අවසානයේදී චුති චිත්තයට අරමුණු වෙන්නේ. ඒවා තමයි ගොඩක් store වෙලා තිබෙන්නේ. එතනට ගිහිල්ලා negative

print කර කර ඉන්න බෑ. මෙහෙදී හොඳ දේවල් කරගෙන යන්න ඕනෑ. ඒක නිසා ගොඩක් පිං කරන්න කුසල් වඩන්න. සමහර වෙලාවට මිනිස්සු කියනවා 'පිං කරන්න එපා සංසාරයේ යනවා' කියලා. නමුත් මෙච්චර කල් ඒ කරපු දේවල් වලින් තමයි තමන්ගේ හිතට සන්තෝසයක් සැනසීමක් කුසලයක් වැඩුණේ. සමහර අසත්පුරුෂ අය නොයෙකුත් දේවල් අපිට කියනවා. එතකොට අපි ඒ අය සන්තෝස කරන්න යනවා. බුදුරාජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා **"පුඤ්ඤානි පරලොකස්මිං, පතිට්ඨා හොන්ති පාණිනං"න්** = 'පින කියන එක සත්වයා හට පරලෝකයේදී පිහිට වෙනවා' කියලා. ඒක නිසා එහෙම කියන අයට අපි සෘජුව කියන්න ඕනේ අපි සම්බන්ධව එයාට කරදට වෙන්න ඕනේ නැති බව.

සමහර වෙලාවට අපිටත් ඔය පිංකම් කරනකොට ඔය වගේ ඒවා කියලා තිබෙනවා. මම බුදුරාජාණන් වහන්සේ වෙනුවෙන් කොඩි පූජා කරන කොට ඒකටත් භව ප්‍රාර්ථනා කරනවා කියලා නොයෙකුත් දේවල් කියනවා. මගේ ප්‍රාර්ථනාව තිබෙන්නේ සංසාරයේ යන්න නොවෙයි නිවන් දකින්න. ඔය වගේ කියාගෙන එක එක කට්ටිය එනවා. මේවගේ අවස්ථා වලදී අපි පරෙස්සම් වෙන්න ඕනෑ.

නමුත් සත්පුරුෂ අය, හිතන්න පුළුවන් අයව එක්කාසු කරගෙන දාන මාන පිංකම් වලට අතගහන්න උදව් කරන්න ඕනෑ. සමහර චරිත තිබෙනවා, ඒගොල්ලෝ ආවට පස්සේ ඒ දානමය පිං කම හරි කබල් වෙනවා. මම මේ කියන්නේ අත් දකින දේවල්.

අපි පිං ගොඩක් කරලා තිබෙන කොට මොකක් හෝ වේවා දේකින් පොඩි වැරැද්දක් වෙලා පාර වැරදුනොත් අපිට පිහිට වෙන්න අඩු තරමින් බ්‍රහ්මලෝකයෙන් හරි එනවා. අර මඝ මානවක තුමාට හිටියා බිරින්දෑවරු හතර දෙනෙක්. එයින් එක්කෙනෙක් වැඩිය පිංකම් මුකුත් කළේ නෑ. එයා කොන්ඩේ පීර පීරා පොට්ටු තිය තියා හිටියේ. අනිත් අය මහන්සිවෙලා දාන මාන දුන්නා සිල් ආරක්ෂා කළා. සමහර චරිත ඉන්නවා ලස්සනට ඇඳගෙන පැළඳගෙන කිසිම දේකට උදව් කරන්නේ එන්නේ නැති. මඝ මානවක තුමාගේ එක බිරිඳක් ආන්න ඒ වගේ. මඝ මානවක තුමා තව්තිසා දිව්‍යලෝකයේ ඉපදිලා බැලුවා අනිත් වැඩ කරපු කට්ටිය කොහෙද ඉපදිලා ඉන්නේ කියලා. එතකොට දැක්කා අනිත් බිරින්දෑවරු දිව්‍යලෝකයේ ඉන්න බව නමුත් එකෙක්නෙක් දිව්‍යලෝකයේ නෑ.

බලනකොට මඝ මානවක තුමා දැක්කා ඒ බිරිඳ කෙකින්නියක් වෙලා මාළු අල්ලනවා. ඊට පස්සේ 'මේ මනුස්සයා මොකවත් පිනක් කරගත්තේ නෑ' කියලා මඝ මානවක තුමාට කරුණාවක් ඇති උනා කියනවා. එහෙම කරුණාව ඇතිවෙනවා. ඊට පස්සේ ඇවිල්ලා කථා බහ කරනකොට කෙකින්නට ඉස්සර හිටපු තැන මතක් වෙලා තිබෙනවා. ඊට පස්සේ එයාට 'සත්තු මරන්න එපා, මැරිච්ච මාළු විතරක් කන්න. නැත්නම් නැවතත් අගතියට යනවා' කියලා ඒක ප්‍රතිපදාවක් කරලා දුන්නා. ඒ කෙකින්න ඒක සීලයක් හැටියට අරගෙන දිගටම කරගෙන ගියා.

පස්සේ දවසක මඝ මානවක තුමා ඒක test කරන්නත් එක්ක මැරිච්ච මාළුවෙක් හැටියට ඇවිල්ලා වැටිලා ඉඳලා කෙකින්න කන්න හදනකොටම දැඟලුවා. එතකොට කෙකින්න

අත්හැරලා දැම්මා. එතකොට මස මානවක තුමා සන්තෝස උනා 'මම කියපු දේ හරි විදියටම පිළිපදිනවා' කියලා. ඒ වගේ උදව්වක් උපකාරයක් ලබා ගන්න හරි පුළුවන් උනේ සත්පුරුෂයෙක් ගාව හිටපු නිසයි. ඒවගේ පිං වැඩිය තිබෙනවානම් කුසල් වැඩිය තිබෙනවානම් පොඩි mistake එහෙකින් එහෙට මෙහට උනත් නැවතත් හරි මාර්ගට පැමිණෙන්න උදව් කරන්න කවුරු හරි ඉන්නවා. අඩු ගණනේ බ්‍රහ්මලෝකයෙන් හරි දිව්‍යලෝකයෙන් හරි එනවා. (දැන් මෙහෙම කිව්වා කියලා කවුරු හරි උදව්වක් දෙයි කියලා නුසුදුසු වැඩ ඒ විදියටම කරගෙන යන්නත් හොඳ නෑ).

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ධ්‍යාන වඩපු කෙනෙක් චුත වෙනකොට ඒ ධ්‍යානය අරමුණු කරලා ඒ අරමුණෙන් ගිහිල්ලා මොකක් හරි බ්‍රහ්මතලයක උපදිනවා. ඉපදිලා ඒ කාලය සම්පූර්ණ උනාට පස්සේ ආපහු එනකොට මනුස්ස ලෝකයේ හිටපු භවාංග සිතමද පහළ වෙන්නේ?

<u>පිළිතුර</u> - නෑ, වෙනස් වෙනවා. එයාට ඒ ජීවිතියේ හරි ළඟ පහත ජීවිතියක තිබ්බ්ච අරමුණක් හරි එහෙම නැත්නම් ඊට සමාන අරමුණක් හරි පහළ වෙනවා. බ්‍රහ්ම ලෝකයෙන් එන එක්කෙනා කවදාකවත් දුගති අරමුණු ගන්නේ නෑ. සෞම්‍ය අරමුණක තමයි හිත පිහිටන්නේ. සෞම්‍ය අරමුණෙන් තමයි මනුස්ස ලෝකයට හරි දිව්‍යලෝකයට හරි යන්නේ.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස අර තිබෙනවා නේද කඩි රැලක් යනකොට ඒ අය ඔක්කොම බ්‍රහ්මලෝකයේ හිටපු කට්ටිය කියලා. එතකොට ඒ අය ඒ තරම් පහත් තත්වයකට වැටෙන්නේ කොහොමද?

<u>පිළිතුර</u> - ඒ වෙන්නේ එකපාරම නොවෙයි. ඒ බුදුරජාණන්වහන්සේ දේශනා කළේ මේ කඩි රැල ඉස්සෙල්ලා ජීවිතියෙදී බ්‍රහ්මයෝ උනා කියන එක නොවෙයි. සංසාරය දිහා බැලුවට පස්සේ එතැන බ්‍රහ්මලෝකයේ හිටපු නැති, සක්විති රජ වෙච්ච නැති කෙනෙක් නෑ කියලයි කිව්වේ. මේ අය සැප විඳලා විඳලා දැන් ඉන්න තැන කිව්වේ. ඒ එක්කම පෙර ජීවිතියේ නොවෙයි. ඊට ආත්ම ගණනාවකට ඉස්සර. සමහර අය ආත්ම දෙක තුනකට වෙන්න පුළුවන්. සමහර අය ආත්ම 100 කට එහා පැත්තේ වෙන්න පුළුවන්. සමහර අය ආත්ම 1000 කට වෙන්න පුළුවන්. මේ වගේ ආත්ම සීයකට හරි ලක්ෂයකට හරි ඉහත දී බ්‍රහ්මලෝකයේ සහ අනෙකුත් ලෝකවල ගමන් කරලා තිබුණාට අද ඉන්න තැන ඒ. ඒක නිසා තමයි කිව්වේ 'මෙතැන සක්විති රජ කෙනෙක් නොවිච්ච කෙනෙක් හොයා ගන්න බෑ' කියලා.

<u>ප්‍රශ්නය</u> - ඒ කියන්නේ ඒ අයත් කවදාහරි ධ්‍යාන වඩලා තිබෙනවා?

<u>පිළිතුර</u> - භවගාමී වෙන්න ධ්‍යාන ලබාගැනීමයි චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගැනීමට ධ්‍යාන කටයුතු කිරීමයි දෙකක්. බුදුරජාණන්වහන්සේ ඒකෙන් දේශනා කරන්නේ ඒ තරම් භයානකයි, ඒ තරම් අස්ථිරයි මේ සියලුම් දේ කියන එක. කොච්චර සම්පත් තිබුනත් කොච්චර බ්‍රහ්මලෝකයේ ගියත් අවසානයේදී මෙන්න මේ තත්වයට

පත්වෙනවා කියන එක. ඒක නිසා කවදාවත් භවයේ ගුණ වර්ණනා කරන්නේ නෑ බුදුරජාණන්වහන්සේ. එකයි ඒ පැහැදිලි කරන්නේ.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස රේරුකානේ චන්දවිමල ස්වාමීන්වහන්සේගේ පොතේ තිබුණා සමහර බ්‍රහ්මයෝ ඒ භවය අත්හරින්න වෙනකොට බොහොම දුකට පත්වෙලා නරක තැන් වලටත් ගිය අවස්ථා තිබෙනවා කියලා.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව්, එහෙම තිබෙනවා. ඒ කියන්නේ මොකක්වත් කුසලයක් කරගන්නේ නැතුව නිකම්ම නිකං හිටියා. මරණය ගැන හිතුවේ නෑ. මට මේක දාල යන්න තිබෙනවා කියලා හිතුවේ නෑ. ඒ වගේ අයට මරණය එනවා කියලා දැන ගත්ත ගමන් හරියට කලබල වෙනවා. ඒක නිසා අපි සූදානමින් ඉන්න ඕනෑ.

අපි හැමවෙලේම හිතන්න ඕනෑ, 'අපි මනුස්සයෙක් හැටියට ආව, කුසල් වැඩුවා. මේක තමයි හැමෝටම සිද්ධ වෙන දේ. ගෙදර හරි කාර් එකේ හරි කොහේ හරි තැනක පපුව හිර වෙලා හරි කලාන්ත ගති ආව, දැන් මම යනවා' කියලා යන්න සූදානම් වෙන්න ඕනෑ. ඕකට බය වෙලා කරන්න දෙයක් නෑ. ඒක කොහොමත් වෙනදේ. අන්න ඒ වගේ හිතපු නැති අයට තමයි ඕක වෙන්නේ. ඒ අයට ධර්මයක් නෑ, මැරෙනවා කියලා හිතුවේ නෑ. අන්න ඒ වගේ අය බය වෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මේ පරණ පාඩමක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක්. සහේතුක සිත්වල කුසල විපාක සිත් 8 තිබෙනවා. ඒ වගේ සහේතුක අකුසල විපාක සිත් නෑ කියලා කියනවා.

<u>පිළිතුර</u> - ඔව්, සහේතුක කියන්නේ මොකක්ද? හේතු සහිත කුසල් සිත් තිබෙනවා = 'අලෝභය' 'අදෝසය' 'අමෝහය' කියන ඒවා සහිත සිත් තිබෙනවා. ඒවගේම 'අලෝභය' 'අදෝසය' 'අමෝහය' සහිත විපාක සිතුත් තිබෙනවා.

අකුසල පැත්තේ හේතු සහිත සිත් 12 තිබෙනවා. 'ලෝභයයි' 'මෝහයයි' මුල් වෙච්ච අකුසල් සිත් 8 ක් තිබෙනවා. 'ද්වේශයයි' 'මෝහයයි' දෙක මුල් වෙච්ච සිත් දෙකක් තිබෙනවා. මේවා ද්වි හේතුක අකුසල් සිත්. 'මෝහය' පමණක් තිබෙන සිත් දෙකක් තිබෙනවා. මේ සිත් දෙක ඒක හේතුකයි. මේ සිත් 12 අකුසල්. හැබැයි මේවා විපාක දෙනකොට ලෝභ මෝහ තිබෙන ද්වේශ මෝහ තිබෙන, මෝහය පමණක් තිබෙන්නා වූ විපාක සිත් කියලා ජාතියක් පහළ වෙන්නේ නෑ. මේ ලෝභ දෝස මෝහ කියන අකුසල් සිත් වලට විපාක වශයෙන් පහළ වෙන්නේ හේතු නැති අහේතුක සිත්.

නරක දේවල් අප්‍රසන්න දේවල් පේන සිත් අකුසල් සිත්. ඒවගේම අහේතුක සෝත විඤ්ඤාණ අහේතුක ඝාණ විඤ්ඤාණ අහේතුක ජිව්හා විඤ්ඤාණ අහේතුක කාය විඤ්ඤාණය සහ සම්පටිච්ඡන සිතක් තිබෙනවා අහේතුකයි, අකුසල පැත්තට. ඒවාගේම සන්තීරණ සිතක් තිබෙනවා අහේතුකයි අකුසල පැත්තට. ආන්න ඒ වගේ සිත් වලින් තමයි විපාක විඳින්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අකුසල් පැත්තට හේතු නොයෙදෙන්න මොකක් හරි විශේෂ හේතුවක් තිබෙනවද?

<u>පිළිතුර</u> - ඒක කුසල් වල තිබෙන සෞම්‍ය ගතියයි අකුසල් වල තිබෙන රෞද්‍ර ගතියයි නිසා. කුසල් වල තිබෙන්නේ හරි සෞම්‍යය මෘදු ගතියක්. අකුසල් හරි ගොරෝසුයි.

<u>ප්‍රශ්නය</u> - දැන් අලෝභ අදෝස අමෝහ මුල් වෙනවා කුසල විපාකයට. අකුසල වලට ලෝභ දෝස මෝහ මුකුත් මුල් වෙන්නේ නැතුව විපාක එනවා?

<u>පිළිතුර</u> - ඔව්, ඒකෙත් හතරක් තිබෙනවා අකුසල උනාට සෞම්‍යයයි. නරක දේ තමයි කාය විඤ්ඤාණය. ඒකෙ හරියට දුක දැනෙනවා.

දැන් අකුසල් 12 හම කරලා තිබෙනවා. එතකොට ඒකෙ විපාක එනකොට එන්නේ චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය වශයෙන්. චක්ඛු විඤ්ඤාණය කොහොමත් උපේක්ෂා සහගතයි. සෝත විඤ්ඤාණයත් උපේක්ෂා සහගතයි. ඝාණ විඤ්ඤාණයත් උපේක්ෂා සහගතයි. ජිව්හා විඤ්ඤාණයත් උපේක්ෂා සහගතයි. එතකොට හිතෙනවා ‘ කොච්චර පවු කරත් කමක් නෑ උපේක්ෂාවෙන් ඉන්න එකනේ’ කියලා. මොකද උපෙක්ෂාවේ දුකක් නෑ. එහෙම හිතුනට ඕක කරකැවිලා අනිත් පැත්තට යනවා. කාය විඤ්ඤාණය එනකොට ඒක හරිම දුක්ඛ සහගතයි.

අකුසල් සිත් 12 ඉස්සෙල්ලා කරපු ක්‍රියාවක විපාක එනකොට දුක්ඛ සහගත කාය විඤ්ඤාණයට දැනෙන දුක පැහෙන ලෝදිය හරි හොඳට උතුරන වතුර කල්දේරමක් වගේ එකක් ඔළුවේ ඉඳන් පහළට වැටෙනකොට නිකං හිතලා බලන්න ඒවෙලාවට අපේ කාය විඤ්ඤාණය කොහොම එකක් වෙයිද කියලා. අන්න ඒ තරම් බරපතල විදියට දුක්ඛ සහගත කාය විඤ්ඤාණය තලනවා පෙලනවා. උපේක්ෂා සහගත කාය විඤ්ඤාණයක් ලැබුණානම් යන්තම් ගොඩින් බේර ගන්න තිබුණා. නමුත් එහෙම නෑ. විපාකයක් හැටියට එන්නෙම දුක්ඛ සහගත කාය විඤ්ඤාණයක්මයි.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස ඒවගේම උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණයක් හරි සෝත විඤ්ඤාණයක් හරි ලැබුණට පස්සේ මනෝ ද්වාරික චිත්ත වීථි ඇතිවෙන්න පුළුවන් ඒවා අරමුණු කරගෙන. අපිට නරක වචනයක් ඇහුනහම දුක හිතට දැනෙනවා, විපාක සිත උපේක්ෂා සහගත උනාට.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් එහෙම තිබෙනවා. සමහර අයට නරක දෙයක් ඇහුවහම ඒ එක්කම තමන්ගේ හදවත හිර කරනවා තෙරපනවා දාඩිය දානවා පුදුම විදියට පීඩා විඳිනවා. කායික වශයෙන් හරි අමාරුවක් විඳිනවා. ඕක දවස් ගණනාවක් සති ගණනාවක් දිගට තිබෙනවා. ඇඟට හරියට දැනෙනවා ඒ වේදනාව. ඒක පිටින් ගැහුවට වඩා උණු අළු වගේ ඇතුලත දවනවා.

ඒකයි සමහර අය කියන්නේ ගැහුවනම් ඉවසන්න පුළුවන් වචනය තමයි ඉවසන්න බැරි කියලා. පිටින් තිබෙන වේදනාවට නම් මොනවා හරි ගාගෙන ඉන්න පුළුවන් නමුත් වචනයක් කිව්වට පස්සේ හරි අමාරුයි ඒක දරන්න.

අනිත් එක තමයි අපේක්ෂාවන් අඩු කරගෙන, කිසිකෙනකුට බැඳෙන්නේ නැතුව කිසි දෙයකට ඇලෙන්නේ නැතුව ඉන්න අධිෂ්ඨාන කරගන්න. දැන් මෙහෙමත් එකක් තිබෙනවා. අසත්පුරුෂ අය ඉන්නවා. ඒ ගොල්ල අසත්පුරුෂයි කියලා අපිට අයින්කරන්නත් බෑ. ඒකෙදි කරන්න තිබෙන්නේ අපි වන්දනා කරනකොට හොඳට හිතට එකඟව පහනක් පත්තු කරලා තුනුරුවන් වන්දනා කරලා හොඳට මෛත්‍රී භාවනාව වඩලා ඒවගේම හොඳට බුදුගුණ භාවනාව වඩලා 'මේ බුදුගුණානුභාව බලයෙන් මේ බුදුගුණ භාවනාවේ අනුභාව බලයෙන් පහන් පූජා කිරීමේ ආනුභාව බලයෙන් මේ මෛත්‍රී වැඩීමේ ආනුභාව බලයෙන් මේ කුසල ධර්මයන්ගේ පිරිසිදු මහානුභාව සම්පන්න කුසල් සිත්වල පිං සිත්වල මහා ආනුභාව බලයෙන් අසත්පුරුෂ අය මට හමු නොවේවා! දකින්න නොලැබේවා! ආරංචියක් නොඇසේවා! ආශ්‍රයක් නොකෙරේවා! කියලා හොඳට උදේ පාන්දරට 21 වතාවක් හැන්දෑවට 21 වතාවක් කරන්න. කෝල් එකක්වත් එන්නේ නෑ. හොඳට කරලා බලන්න. එතකොට ඒ ගොල්ලන්ට අපිව අමතක වෙලා වගේ එන්නේ නැතිකොට අපිට කිසි කරදරයක් නෑ. මේක තිබෙන්නේ බෝධිසත්ව චරිතයක.

බෝධිසත්වයන් වහන්සේගේ චරිතයක තිබෙනවා

'බාලං න පස්සෙ න සුණෙ, න ච බාලෙන සංවසෙ;
බාලෙනල්ලාප සල්ලාපං, න කරෙ න ච රොචයෙ' කියලා.

අකිර්ති කියන පණ්ඩිතතුමා තපස් රකිනවා එක දිවයිනක. සිටු තනතුරත් අත්හැරලා අව්ව සැරට තිබෙන තැනකට ගිහිල්ලා තපස් රකිනවා. මෙහෙම තපස් රකින කොට ඒ තාපසතුමාගේ තපස් තේජාවෙන් ශක්‍ර දේවේන්ද්‍රයාගේ ආසනය උණුසුම් උනා. ඒකට හේතුව බලන ශක්‍රදේවේන්ද්‍රයා දැක්කා අකිර්ති පණ්ඩිතයා තපස් දම් පුරනවා. ශක්‍රදේවේන්ද්‍රයාට හිතුණා මේ තවුසා තපස් දම් පුරන්නේ සක්දෙව් රාජ්‍ය බලාපොරෝත්තුවෙන්ද කියලා දැනගන්න. එහෙම හැඟීමක් ඇතිවෙලා පරික්ෂා කරන්න ඕනෑකමක් ඇති උනා.

දිව්‍යලෝක වල ඉන්න ගොඩක් අය ස්වාමීන්වහන්සේලාටත් දාන සීල භාවනා, බෝධි පූජා, සත් බුදු පූජා, තෙසැත්තා පූජා ආදිය කරන අයටත් බයයි. ඒකට හේතුව ඒ අය පිං රැස් කරගෙන පිනෙනේ ගුණයෙන් පිරිලා මනුස්ස ලෝකෙන් චුත වෙලා දිව්‍යලෝකවල ඉපදෙනකොට ඒ අයගේ තනතුරු නැතිවෙයි කියලා. ඒක නිසා ඒ අය එහෙන් කීප දෙනෙක් මෙහාට එවනවා ඒ අයගේ වැඩට බාධා කරලා හිත් අවුල් කරන්න.

ශක්‍රදේවේන්ද්‍රයාටත් ඒ බය ඇති උනා. ශක්‍රදේවේන්ද්‍රයා අර තාපසතුමාව පරික්ෂා කරන්න ගියා. මේ වේලාවේ මේ තාපස තුමා කරකොළ තම්බලා රස්නේ නිසා වළඳන්න නිවෙනකම් තියාගෙන හිටියා. ඒ වේලාවේ තාපස වේසයෙන් එන කෙනෙක් දැකලා අකීර්ති තාපස තුමාට හිතෙනවා 'හොඳ අවස්ථාවක් මේක දානයක් දෙන්න' කියලා ඒ කරකොළ ටික ඔක්කෝම ඒ තාපස තුමාට පූජා කළා. අකිර්ති තාපස තුමා බඩ ගින්නේ හිටියා. නමුත් දානය දීම පිළිබඳව හරිම සන්තෝසයි. ඊට පස්සේ දෙවෙනි දවසෙත් මේ විදියට ශක්‍රදේවේන්ද්‍රයා තාපස වේසයෙන් ගියා. ඒ දවසෙත් දානය පූජා කළා. දැන් දවස්

දෙකක් කෑම නෑ. හැබැයි හරි සන්තෝසයි. තුන්වෙනි දවසෙත් මේ විදියටම දානය පූජා කළා. එදාත් හරිම සන්තෝසෙන් හිටියා. ඇඟට පණ නැතිලු නමුත් දානය දීපු සන්තෝසය සතුට මේ තාපසතුමාට තිබෙනවා.

ඊට පස්සේ තාපස වේසය අයින් කරලා ශක්‍රදේවේන්ද්‍රයා නියම දේව ලීලාවෙන් ඇවිල්ලා අහනවා 'මොකටද මේ තපස් රකින්නේ?' කියලා. එතකොට කියනවා 'භව ගමන හරිම දුකයි. මම මේ භවයෙන් මිදෙන්නයි තපස් රකින්නේ වෙන මොකකටවත් නොවෙයි' කියලා. එතකොට ශක්‍රදේවේන්ද්‍රයා හරියට පැහැදෙනවා. පැහැදිලා කියනවා 'ඔබ තුමා කෙරෙහි මම පැහැදුනා, ඕනෑම වරයක් ඉල්ලන්න' කියලා. වර කීපයක්ම දුන්නා එයින් එකක් තමයි -

බාලං න පස්සෙ න සුණෙ = මට බාලයෝ දකින්න නොලැබේවා මට බාලයෝ ගැන අහන්න නොලැබේවා

න ච බාලෙන සංවසෙ = බලයන් සමග ආශ්‍රයක් සංවාසයක් ඇති නොවේවා

බාලෙනල්ලාප සල්ලාපං, න කරෙ = බාලයන් සමග අල්ලාප සල්ලාප කථා බහක් නොකෙරේවා

න ච රොචයෙ = එසේ කිරීමට කැමැත්තක් ඇති නොවේවා!

එතකොට ශක්‍රදේවේන්ද්‍රයෝ අහනවා එච්චරටම අකමැති වෙන්න හේතුව මොකක්ද කියලා. එතකොට ඒ තාපස තුමා කියනවා බාලයන්ගෙන් වෙන හානිය. ඒක නිසා සත්පුරුෂ ආශ්‍රය ප්‍රාර්ථනා කිරීම ඔය විදියටම කරන්න ඕනෑ, බාලයෝ හමු නොවේවා! කියලා. හොඳයි හැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.